මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**PRE/2024/98** **2024.09.19**

# ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

## සමාජ මාධ්‍ය හරහා ව්‍යාජ තොරතුරු ප්‍රචාරය වීම

මැතිවරණ කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම නිදහස්, සාධාරණ හා විශ්වාසනීයත්වයෙන් යුතුව පැවැත්වීම අරමුණු කොට ගෙන ඊට අදාළ ඡන්ද ප්‍රකාශ කිරීම, ඡන්ද ගණන් කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව සියලුම ව්‍යවස්ථාපිත කටයුතු මේ වන විට මනා ලෙස සංවිධානය කොට ඇති අතර එයට අදාළ සියලුම පාර්ශ්ව වෙත අවශ්‍ය චක්‍රලේඛ, උපදෙස් හා නියෝග ද ලබා දී ඇත.

ජනාධිපතිවරණයට අදාළ මෙම සියලුම කාර්යයන් මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත රාජ්‍ය නිලධාරීන් විසින් ඉටු කරනු ලබන අතර, ඒ පිළිබඳව අපේක්ෂකයන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්, මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයන්, විදේශීය නිරීක්ෂණ නියෝජිතයන් ඇතුලු ඕනෑම පුරවැසියෙකුට දැක බලාගත හැකි වන අන්දමේ විනිවිදභාවයකින් යුතුව ක්‍රියාත්මක කෙරේ.

එසේම ඡන්ද ගණන් කිරීමේ කටයුතු හා ප්‍රතිඵල සකස් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම රාජ්‍ය නිලධාරීන් විසින් අතින් (manually) සිදු කරනු ලබන අතර එම ලේඛන සකස් කිරීම්වල නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සඳහා පමණක් පරිගණක තාක්ෂණය උපයෝගී කොට ගනී. එසේම ඡන්ද ගණන් කිරීමේ දී හා ප්‍රතිඵල සකස් කිරීමේ දී එම ප්‍රතිඵල ලේඛන ඒවා පළමුව සකස් කළ නිලධාරීන්ට අමතරව වෙනත් නිලධාරී කණ්ඩායමක් විසින් පරීක්ෂා කිරීම සිදුකරන අතර, අනතුරුව ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් විසින් නැවත සුපිරි පරීක්ෂාවක් සිදු කරනු ලැබේ. ඉන් අනතුරුව පරිගණක ආශ්‍රයෙන් ලබාගන්නා ලේඛන සමඟ අතින් (manually) සකස් කළ ප්‍රතිඵල ලේඛන සැසඳීමක්ද සිදුකිරීමෙන් පසුව ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලැබේ.

ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉතා සංවිධිත ක්‍රියාවලියක් අනුගමනය කළද ඊට පරිභාහිර වෙනත් පාර්ශ්ව වෙතින් මැතිවරණ ප්‍රතිඵල පරිගණකගත කිරීමේ දී යම් යම් අක්‍රමිකතා සිදු වන බවට මත පළ කරමින් උපක්‍රමිකව සමාජ මාධ්‍ය හරහා ජනතාව නොමග යැවීමට ක්‍රියා කරන බව මැතිවරණ කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

එබැවින් ඡන්දය ප්‍රකාශ කිරීම, ඡන්ද ගණන් කිරීම හා ප්‍රතිඵල සකස් කිරීමේ දී කිසිදු අක්‍රමිකතාවක් සිදු නොවන පරිදි හා එකී ව්‍යවස්ථාපිත කටයුතු නිසි පරිදි සිදු වන බව මැතිවරණ කොමිෂන් සභාව වගකීමෙන් යුතුව ප්‍රකාශ කර සිටින අතර ඡන්දදායකයන්, අපේක්ෂකයන් ඇතුළු සියලු දෙනා කොමිෂන් සභාවේ කාර්යයන් කෙරෙහි විශ්වාසය තබා ක්‍රියා කරනු ඇතැයි වැඩිදුරටත් අපේක්ෂා කරමි.

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)